“කවරෙකු යම් සමාජයක් අනුකරණය කරන්නේ ද ඔහු ඔවුන් අතරින් කෙනෙකි.”

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී: “කවරෙකු යම් සමාජයක් අනුකරණය කරන්නේ ද ඔහු
ඔවුන් අතරින් කෙනෙකි.”
[හසන් ගණයට අයත් හදීසයකි]

දේවත්වය ප්රතික්ෂේප කරන්නන්, දුෂ්ඨයින් හා දැහැමියන් අතරින් යම් පිරිසක්, කවරෙකු අනුකරණය කළේ ද, -එනම් ඔවුන්ට ආවේනික විශ්වාසයන්, නැමදුම් හා සිරිත් විරිත් අතරින් කිසිවක් පිළිපින්නේ ද - ඔහු ඔවුන්ගෙන් කෙනෙකු වන්නේය. මක්නිසාදයත් මතුපිටින් ඔවුන් අනුකරණය කිරීම අභ්යන්තරයේ ද ඔවුන් අනුකරණය කරන තරමට යොමු කරනු ඇත. සැබැවින්ම පිරිසක් අනුකරණය කිරීම පැහැදීමේ ප්රථිඵලයක් බවට සැකයක් නැත. ඔවුන්ට ආදරය කිරීම ඔවුනට ගරුබුහුමන් කිරීම ඔවුනට යටත් වීම වෙත යොමු කරයි. මෙය යම් සමාජයක් අනුකරණය කිරීමට පුද්ගලයා යොමු කරන අතර අවසානයේ අභ්යන්තරයේ මෙන්ම නැමදුම්වල ද ඔවුන් අනුකරණය කිරීමට යොමු වේ. -අල්ලා අප ආරක්ෂා කරත්වා-

https://sunnah.global/hadeeth/si/show/5353